සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**රහස්‍යයි**

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
## க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

විෂයය අංකය / பாட இலக்கம்: **21**

විෂයය / பாடம்: **සිංහල භාෂාව හා සාහිත්‍යය**

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 1 | 21. | 1 | 31. | 3 |
| 02. | 2 | 12. | 3 | 22. | 2 | 32. | 1 |
| 03. | 3 | 13. | 2 | 23. | 4 | 33. | 2 |
| 04. | 2 | 14. | 3 | 24. | 2 | 34. | 1 |
| 05. | 1 | 15. | 2 | 25. | 3 | 35. | 4 |
| 06. | 1 | 16. | 4 | 26. | 4 | 36. | 2 |
| 07. | 3 | 17. | 1 | 27. | 1 | 37. | 1 |
| 08. | 1 | 18. | 2 | 28. | 2 | 38. | 3 |
| 09. | 4 | 19. | 4 | 29. | 2 | 39. | 4 |
| 10. | 2 | 20. | 3 | 30. | 4 | 40. | 3 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: **25 / 40**

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: **25 / 40**

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## II පත්‍රය

ප්‍රශ්න අංකය 01

අපේක්ෂණය - භාෂා පරිචය ඇගයීම

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනු ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. **කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.

(අ) වළ (ආ) වල

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.

"ඒ සමිතියේ සභාපතිත්වය දරණ තැනැත්තා දේශදේශාන්තරයෙහි කීර්තියක් ඇති අග්‍රගන්‍ය පඬිවරයෙකි."

(iii) පහත සඳහන් පද සන්ධි කොට ලියා, සන්ධි වර්ගය නම් කරන්න.

(අ) සහ + උදර (ආ) රූක් + අත්තන

(iv) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් **උපසර්ග පද දෙකක්** උපුටා දක්වන්න.

"අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නව ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ප්‍රතිඵලදායක බව විද්‍යාල්පතිතුමා පැවසීය."

(v) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) පළල (ආ) සරල

(vi) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.

(අ) තමාගේ ම අභිමතයට අනුව වැඩ කරන

(ආ) එක් ඇසක් පමණක් පෙනෙන තැනැත්තා

(vii) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) අප සංගමයේ සභාපති හොහොත් සභාපතිනිය සභාව අමතන්නේ ය.

(ආ) ලාංකික ක්‍රීඩකයෝ තරගය ජය ගනිවි.

(viii) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.

(අ) දරුවන් ගී **ගයද්දී** දෙමවුපියෝ තුටු වෙති.

(ආ) "**බල** සුබ නිමිති පෙරමග තැකතටත් වැඩි"

(ix) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.

(අ) පාසල් ශිෂ්‍යයා

(ආ) විදෙස් ප්‍රවෘත්ති

(x) පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් යුගල පද දෙක තෝරා වෙන වෙන ම ලියන්න.

"ගෙවල් දොරවල් බැලීමට පැමිණි තරුණයාගේ වං හුං ඇනගත් මවුපියෝ ඔහුට අකැමති වූහ."

(ලකුණු 02 × 10 = 20 යි)

(i) (අ) ආවාටය, පොළවේ ගැඹුරට හෑරූ / කණින ලද / ස්වභාවික ව පිහිටි ස්ථානය

(ආ) වනය, වනාන්තරය, අරණ, අටවි, කැලෑව, අරණ්‍යය

(ii) දරන, අග්‍රගණ්‍ය

(iii) සහ + උදර = සහෝදර - ස්වරාදේශ සන්ධිය / සරදෙස් සඳ

රුක් + අත්තන = රුක්කත්තන - ද්විත්ව රූප සන්ධිය / දෙරූ සඳ

(iv) අප, අනු, ප්‍රති (උපසර්ගය සහිත පදය උපුටා දක්වා තිබුණ ද ලකුණු දෙන්න.)

(v) (අ) පටු, දිග, දීර්ඝ, ආයාම, අයම්

(ආ) සංකීර්ණ, සංහත

(vi) (අ) අත්තනෝමතික / හිතුවක්කාර

(ආ) කණ්‍ණා, කාණ

(vii) (අ) අප සංගමයේ සභාපති නොහොත් සභාපතිනිය සභාව අමතන්නී ය.

අප සංගමයේ සභාපතිනිය නොහොත් සභාපති සභාව අමතන්නේ ය.

(ආ) ලාංකික ක්‍රීඩකයන් තරගය ජය ගනිති.

(viii) (අ) අසම්භාව්‍ය ක්‍රියා / කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා / ආවශ්‍යක කෘදන්ත

(ආ) විධි ක්‍රියා / විදි කිරිය

(ix) (අ) පාඨශාලා ශිෂ්‍යයා, පාසල් සිසුවා / පාසල් සිසු

(ආ) විදෙස් පුවත්, විදේශීය ප්‍රවෘත්ති / විදේශ ප්‍රවෘත්ති

(x) ගෙවල් දොරවල්, වං හුං

*(2 x 10 = 20)*

ප්‍රශ්න අංකය 02

අපේක්ෂණය - සංශ්ලේෂණ හැකියාව මැනීම

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරෙන් වටහා ගත යුතු ය. රචනයෙහි විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකි ය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරෙන් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.

2. පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) ජංගම දූරකථනය මුළු ලෝකය ම සියතට ගත හැකි විස්මය ජනක උපකරණයකි. වර්තමානය වන විට එය බහුකාර්ය උපකරණයක් බවට පත්වී ඇත. මිනිසාගේ යහපතට මෙන් ම අයහපතට ද එය භාවිත කළ හැකි ය. නූතන තරුණ පරම්පරාව සමාජ ජාලා වෙබ් අඩවි භාවිතයට බෙහෙවින් ම ඇබ්බැහි වී ඇත්තේ ද ජංගම දූරකථනය නිසා ය. මේ අතර ජංගම දූරකථනය හා එමගින් භාවිත කළ හැකි සමාජ ජාලා වෙබ් අඩවි අධ්‍යාපනික කාර්යය මෙන් ම සමාජ යහපත ද වෙනුවෙන් භාවිත කළ හැකි අවස්ථා එමට ය. එය තරුණ පරම්පරාවේ අධ්‍යාපනික සංවර්ධනයට මෙන් ම සමාජ ප්‍රගමනයට ද රටේ සංවර්ධනයට ද දායක කර ගත හැකි ය. සමස්ත ප්‍රජාව ම මේ පිළිබඳ අවධානය යොමු කළ යුතු කාලය එළැඹ ඇත.

(ආ) ක්‍රීඩාව රටක සෞඛ්‍ය සම්පන්නභාවය පිළිබිඹු කරන දර්ශකයකි. ශ්‍රී ලංකාව ද විවිධ ක්‍රීඩා ඉසවු මඟින් ලෝකය තුළ නමක් රඳවාගෙන ඇත. ක්‍රිකට්, මලල හා දැල්පන්දු ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගනියි. ක්‍රීඩාව මඟින් රටේ තරුණ පරම්පරාවෙහි සෞඛ්‍යය, සමබර පෞරුෂය, නායකත්ව ගුණාංග, ජය පරාජය ඉවසීමේ ගුණය හා සාමූහිකත්වය ආදි යහපත් ගුණාංග රාශියක් වර්ධනය වේ. ක්‍රීඩාවට මුල් තැනක් දී ක්‍රීඩකයන් දිරිගැන්වීම රටක වගකීමක් හා යුතුකමක් වෙයි. නූතන පරම්පරාව ක්‍රීඩාව වෙත නැඹුරු කරවීමට අවශ්‍ය පෙළඹවීම ඇති කිරීමත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමත් මඟින් ශ්‍රී ලංකාව ලෝකයෙහි දිදුලන නාමයක් බවට පත් කර ගත හැකි ය.

(ඉ) ශ්‍රී ලංකාව විදේශීය සංචාරකයන්ගේ පාරාදීසයකි. අතීත මිනිසුන් විසින් දායාද කරන ලදුව ප්‍රෞඪ ජාතියක අනන්‍යතාව රැක දෙන විවිධ විස්මිත නිර්මාණ ද ස්වභාව සෞන්දර්යයෙන් අනූන වූ ස්ථාන ද නරඹා සතුටු වීමට සංචාරකයෝ ඉමහත් කැමැත්තක් දක්වති. මෙරටට විශාල විදේශ විනිමයක් උපයා දෙන එම ජාතික උරුමයන් වර්තමානය වන විට විනාශ මුඛයට යමින් පවතින බව බොහෝ දෙනාගේ අදහස යි. මේ උරුමයන්ට හානි පමුණුවන්නේ ද මිනිසා ම ය. එබැවින් අනාගත පරම්පරාව සඳහා ඒවා රැකගැනීමට කටයුතු කිරීම අප කාගෙත් වගකීමක් හා යුතුකමක් ද වේ.

(ඊ) ස්වාභාවික විපත් සහ ආපදා තත්ත්ව ගැන ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් නිතර අසන්නට ලැබේ. ගංවතුර, නායයෑම් හා නියඟ වැනි තත්ත්ව ඒ අතර ප්‍රධාන වේ. මිනිසාට ජීවය දෙන පරිසරයට මිනිසා විසින් ම කරනු ලබන විවිධ අකටයුතුකම් නිසා ස්වභාව ධර්මය මිනිසාට එරෙහිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම ස්වාභාවික ව්‍යසන ඇති වේ යැයි සැලකේ. එම නිසා ස්වාභාවික විපත්වලින් ජනතාව මුදවා ගැනීමත් එමගින් විනාශ වන දේපළ හා ජීවිත රැකගැනීමත් සඳහා ක්‍රමෝපාය යෙදීම මිනිසාගේ පරම යුතුකම බව කිව යුතු ය.

(ලකුණු 25 යි)

(අ) ජංගම දූරකථනය සහ සමාජ ප්‍රගමනය

අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා ජංගම දූරකථන භාවිතය

(ආ) ක්‍රීඩාව මඟින් ශ්‍රී ලංකාව ලෝකයේ දිදුලන රටක් බවට පත් කරමු

ශ්‍රී ලංකාව ලෝක පූජිත කිරීම සඳහා ක්‍රීඩාව බල ගන්වමු

ශ්‍රී ලංකා නාමය ලොව දිදුලන්නට ක්‍රීඩා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරමු

(ඉ) ජාතික උරුමයන් සුරකින සංචාරක ව්‍යාපාරයක අවශ්‍යතාව

සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සහ ජාතික අනන්‍යතාව රැක ගැනීම

ජාතික අනන්‍යතාව නොනසන සංචාරක ව්‍යාපාරයක් ගොඩ නගමු

(ඊ) ස්වභාවික ආපදා කළමනාකරණය කර ගනිමු

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි**

| | | |
|---|---|---|
| 01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08යි |
| 02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - | ලකුණු 12යි |
| 03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05යි |

| | | | |
|---|---|---|---|
| 01. | සාරවත්භාවය | - | ලකුණු 07යි |
| | විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම | - | ලකුණු 01යි |

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12යි
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05යි
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ සැලකිය යුතු යි

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට ආනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය - ★ වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කර ගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු 02 - 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.

ප්‍රශ්න අංකය 03
අපේක්ෂණය - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

**3.** පහත දැක්වෙන පාඨය වචන **65 - 75** අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

"වර්තමාන කෙටිකතාව පැරණි කෙටිකතාවලට කිසිම හෑ සබඳකමක් නැති අපූරුවක් නොව ක්‍රමයෙන් වෙනස් වීමෙන් අලුත් ස්වරූපයක් ගත් පැරණි කෙටිකතාවමයි." යනු මාර්ටින් වික්‍රමසිංහගේ කියුමකි. ඔහු මේ මතය පවසන්නේ වර්තමාන සිංහල කෙටිකතාව අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලිය, සිංහල ජාතක පොත යනාදි අපේ චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථයන්හි එන කථාවස්තු හා සම්බන්ධ කරමිනි. වික්‍රමසිංහ විශේෂයෙන් ම සිංහල ජාතක කථාත් වර්තමාන කෙටිකතාත් අතර බොහෝ සමාන ලක්ෂණ දකින්නේ වස්තු විෂය, යථාර්ථ රීතිය යන අංශවලිනි. වර්තමාන කෙටිකතා ජාතක කථාවලින් වෙනස් වන්නේ වස්තු විකාසනය අතින් බව ඔහු පෙන්වා දී ඇත්තේ ය.

චිරන්තන සිංහල සාහිත්‍ය ග්‍රන්ථයන්හි එන කථාවස්තු හැරුණු විට චරිත කථා, ඉතිහාස කථා, දේව කථා, මහදැනමුත්තාගේ කථා ආදි ජන කතාන්තර, කවි කොළ යනාදි වශයෙන් කථා ප්‍රවෘත්ති කියැවෙන ගද්‍ය පද්‍ය සාහිත්‍යාංග රාශියක් අපට ඇත.

ප්‍රමාණය අනුව සලකන කල කෙටි වූ කතාවේ ඉතිහාසය බොහෝ ඈතට දිවෙන නමුත් නවකථාව, කෙටිකතාව යන නම් ඇති ඒවාට ම සීමා වූ විශේෂ ලක්ෂණ සහිත නව සාහිත්‍යාංග දෙක සිංහලයට පුරුදු වූයේ බටහිර සාහිත්‍යයේ ආභාසය ඇති ව බව කිව මනා ය. මෙරට ඉංග්‍රීසි ආධිපත්‍යයට යටත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවුණු සාහිත්‍යය මෙහි පැතිරී යාමත් සමඟ ම ඒ සාහිත්‍යය ආදර්ශයට ගෙන ඉන් ආභාසය ලබමින් සිංහල සාහිත්‍ය පෝෂණය කිරීමට ගත් එක් උත්සාහයක එක් ප්‍රතිඵලයකි, මෙරට වර්තමාන කෙටිකතාව ආරම්භ වීම. එසේ ම සිංහල පුවත්පත් සඟරා ද කෙටිකතාවේ දියුණුවට මහත් රුකුලක් වූයේ ය.

(ලකුණු 10 යි)

සාරාංශකරණය :

අන්තර්ගතය

(i) වර්තමාන කෙටිකතාව පැරණි කෙටිකතාවල විකාසනයක් බව මාර්ටින් වික්‍රමසිංහයන්ගේ අදහස යි.

(ii) වස්තු විෂය, යථාර්ථ රීතිය යන අංශවලින් ජාතක කථා හා කෙටිකතා අතර සම්බන්ධතාවක් තිබුණත් වස්තු විකාසනය අතින් වෙනස් ය.

(iii) මේ හැරුණු විට චරිත කථා, ඉතිහාස කථා, දේව කථා, මහදැනමුත්තා ආදි ජනකතා හා කවි කොළ ඇතුළත් ගද්‍ය පද්‍ය සාහිත්‍යාංග පවතී.

(iv) නවකථාව, කෙටිකතාව යන ඒවාට ම සීමා වූ විශේෂ ලක්ෂණ සහිත සාහිත්‍යාංග සිංහලයට හුරු වූයේ ඉංග්‍රීසි ආධිපත්‍යයෙන් පසු බටහිර පොත් කියවීමෙන් ලද ආභාසයෙනි.

(v) කෙටිකතාවේ දියුණුවට පුවත්පත්, සඟරා ඉවහල් විය.

සාරාංශකරණය:

මුළු ලකුණු ප්‍රමාණය 10 යි.

ලකුණු විග්‍රහය:

01. අන්තර්ගතය - ලකුණු 06 යි.
02. වචන ගණන - ලකුණු 02 යි.
03. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි.

★ වචන ගණන 80 ඉක්මවන කල්හි මුල් වචන 75 පමණක් ඇගයීමට ලක් කරන්න.

★ වචන ගණන 60ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් පමණක් සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.

★ ඡේද බෙදා තිබුණොත් ශිල්පීය දක්ෂතා කොටසින් ලකුණක් අඩු කරන්න.

★ එක යට එක අසම්බන්ධිත වාක්‍ය ලෙස ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණ 02කි.

★ වචන ගණන 80ට වැඩි කල්හි හෝ 60ට අඩු කල්හි ලකුණක් අඩු කරන්න.

★ දුර්වල සාරාංශ සඳහා බිංදුව නො දී ලකුණු 03ක උපරිමයකට යටත් ව ලකුණු පිරිනමන්න.

**ප්‍රශ්න අංකය 04**

**අපේක්ෂණය** - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

පූර්ව බෞද්ධ යුගයේ සමාජ ජීවිත තත්ත්වය පිළිබඳ වටිනා තොරතුරු රැසක් 'ජාතක කථා' මගින් අනාවරණය වන්නේ ය. ඒ සමාජයෙහි අධ්‍යාපනයට ලැබුණේ විශිෂ්ට තැනකි. මේ කථාවලට අනුව ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා ගැනීමේ භාග්‍යය අත් වූයේ බ්‍රාහ්මණයනට, රාජවංශිකයනට සහ ධනවත් ව්‍යාපාරිකයනට පමණි. ඒ සමාජයේ හැම විට ම පාඨයේ ගුරුකමෙහි නියුක්ත වූයේ බ්‍රාහ්මණ වංශිකයෙකි. හෙතෙම දිසාපාමොක් ඇදුරු –දිසාවේ ප්‍රධාන ආචාර්යවරයා– යනුවෙන් හැඳින්විණි. විශාල ප්‍රදේශයක ඉගැන්වීමේ කටයුතුවල භාරය පැවරුණේ එබඳු ආචාර්යවරයකුට ය.

දිසාපාමොක් ආචාරීන් කෙරෙන් ලැබුණු උසස් අධ්‍යාපනයෙහි දේශපාලන විද්‍යාව සහ යුද්ධ පුහුණුවක් ද ඇතුළත් විය. මේ ඉගෙනීම වයස දහසය වන විට නිමාවට පත් කළ බව පෙනේ. තරුණයන් විවාහ ජීවිතයට ඇතුළු වීමත් පියවරුන්ගේ වගකීමෙන් කොටසක් තමන් කෙරෙහි පවරා ගැනීමත් සොළොස් වියෙහි දී සිදු වීම සාමාන්‍ය සිරිත විය.

සැම පුරාතන සංස්කෘතියකට ම පොදු වූ අයුරින් භාරතීය සංස්කෘතියේ සියලු අධ්‍යාපන සහ අධ්‍යයන විධි වාචික මාධ්‍යය උපයෝගි කොට ගති. එවක ලිවීමේ කලාව ගැන දැනීම නුවූ බව මින් අදහස් නො කැරෙයි. ලියුම් සහ වෙනත් ලේඛන ගැන සඳහන් නොයෙක් තැන් වෙයි. වෛදේහ රජුගේ බිසව වූ උදුම්බරා දේවිය මහෞෂධ පණ්ඩිතයනට අග්ගලාවෙක සඟවා ලියුමක් යැවූ බව උම්මග්ග ජාතකයෙහි සඳහන් වෙයි. මහෞෂධයන්ගේ බිරිඳ වූ අමරා දේවිය විසින් තමා හට අල්ලස් සඳහා තෑගි එවූ තැනැත්තන්ගේ නම් ද ඒ තෑගි පිළිබඳ විස්තර ද ඒවා එවුණු දින මාසාදිය ද තල් පතක ලියා තැබුණු වග ඒ කථාවෙහි ම පැවසෙයි.

තව ද ශිෂ්‍යයන් යම් කරුණක් පොතපත කියවීමෙන් දැනගත් බව කිව හැකි නො වේ. කියවීම සඳහා පිළියෙල වූ පොතපතක් නො වූ බැවිනි. ගුරුවරයා කට වචනයෙන් ඉදිරිපත් කළ සූත්‍රයන් ඉගෙන ගෙන ධාරණය කරනු වස් නොයෙක් විට පුනරුච්චාරණය කිරීම ශිෂ්‍යයා විසින් කරනු ලැබිය යුතු ය. උගත් මිනිසා හැඳින්වූයේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති යන අරුත දෙන බහුශ්‍රැත යන සකු වදනෙනි.

(i) ජාතක කථාවලින් හෙළිවන පරිදි ශාස්ත්‍රීය අධ්‍යාපනයක් ලබා ගැනීමේ භාග්‍යය උදාවූයේ කවුරුන්ට ද?

(ii) දිසාපාමොක් ආචාරීන්ගෙන් ලැබුණු උසස් අධ්‍යාපනයෙහි ඇතුළත් අංග කවරේ ද?

(iii) ජීවිතයේ සොළොස්වන විය වැදගත් කොට සලකනු ලැබීමට හේතු වූ කරුණු මොනවා ද?

(iv) පුරාතන භාරතීය සංස්කෘතියේ ලිවීමේ කලාව පැවති බව තහවුරු කිරීමට දක්වා ඇති සාධක කවරේ ද?

(v) පොතපත කියවීමෙන් නොව කට වචනය හා ධාරණය මුල් කොට ගෙන පැරණි ශිෂ්‍යයන් ශාස්ත්‍ර උගත් බව සනාථ කිරීමට මෙම ලේඛකයා යොදූ සාධක **දෙක** මොනවා ද?

(ලකුණු 10 යි)

(i) බ්‍රාහ්මණයනට, රාජවංශිකයනට, ධනවත් ව්‍යාපාරිකයනට

***(කරුණු 03 ම ලියා ඇත්නම් ලකුණු 02 යි. කරුණු 02ක් ලියා ඇත්නම් ලකුණු 01 යි. එක කරුණක් ලියා ඇත්නම් ලකුණු නැත.)***

(ii) දේශපාලන විද්‍යාව, යුද්ධ පුහුණුව

*(ලකුණු 02 යි)*

(iii) i. තරුණයන් විවාහ දිවියට ඇතුළු වීම

ii. පියවරුන්ගේ වගකීමෙන් කොටසක් තමන් කෙරෙහි පවරා ගැනීම

*(ලකුණු 02 යි)*

(iv) i. උදුම්බරා දේවිය මහෞෂධ පණ්ඩිතයනට අග්ගලාවෙක සඟවා ලියුමක් යැවූ බව උම්මග්ග ජාතකයෙහි සඳහන් වීම

ii. මහෞෂධයන්ගේ බිරිඳ වූ අමරා දේවිය විසින් තමා හට අල්ලස් සඳහා තෑගි එවූ තැනැත්තන්ගේ නම් ද ඒ තෑගි පිළිබඳ විස්තර ද ඒවා එවුණු දින මාසාදිය ද තල් පතක ලියා තැබුණු වග උම්මග්ග ජාතකයෙහි සඳහන් වීම

*(ලකුණු 02 යි)*

(v) පුනරුච්චාරණය කිරීම

උගත් මිනිසා 'බහුශ්‍රැත' යන නමින් හැඳින්වීම

*(ලකුණු 02 යි)*

ප්‍රශ්න අංකය 05

අපේක්ෂණය - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම.

5. පහත දැක්වෙන විස්තරය පදනම් කොට ගෙන **අත් පත්‍රිකාවක්** සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

ජයනි කරුණාතිලක වන ඔබ අනුරාධපුර මහ වීදියේ, අංක 42 දරන ස්ථානයේ 'සයුර' නමින් පොත්හලක් විවෘත කිරීමට සැලසුම් කරමින් සිටින්නෙහි ය. එය දිනපතා පෙ. ව. 8.00 සිට ප. ව. 7.00 තෙක් විවෘත ව තිබෙන අතර පෝය දිනවල දී වසා තැබේ. විවිධ විෂයවලට අයත් පොත්පත් මෙන් ම පාසල් උපකරණ ද මිලට ගැනීමේ අවස්ථාව මෙමඟින් උදා කෙරෙයි. ජනවාරි මාසය තුළ මිලට ගන්නා ද්‍රව්‍ය වෙනුවෙන් 10%ක වට්ටමක් ද ලබා දීමට අපේක්ෂා කෙරේ.

**නැතහොත්**

පහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් පුවත්පතක පළකිරීම සඳහා යෝග්‍ය **වාර්තාවක්** සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

තුරුසරුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද කලා උලෙළට සහභාගි වූ පුවත්පත් වාර්තාකරුවකුගේ සටහනක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| දිනය | : | 2018.11.30 |
| වේලාව | : | ප. ව. 2.00 |
| ස්ථානය | : | ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගණය, තුරුසරුගම |
| ප්‍රධාන ආරාධිතයා | : | ප්‍රවීණ කලාකරු සමරනාථ එදිරිසූරිය |
| විශේෂ දේශනය | : | මහාචාර්ය සුසිල් රාජකරුණා |
| මාතෘකාව | : | සාහිත්‍යයේ නව ගමන්මග |

තිළිණ හා සහතිකපත් ජයග්‍රාහකයන් වෙත පිරිනැමීම මෙදින සිදු විය. ප්‍රදේශයේ සාහිත්‍යකරුවන් තිදෙනකුට ද 'සාහිත්‍යදීපනී' සම්මානය පිරිනැමිණි. නැටුම් ගැයුම් ආදි විචිත්‍රාංග රාශියක් ද තිබිණ. පුවත්පත් වාර්තාකරු ඔබ යැයි සිතන්න.

(ලකුණු 15 යි)

**අත් පත්‍රිකාව**

| | | |
|---|---|---|
| 1. | ආකෘතිය | ලකුණු 05 යි. |
| 2. | අන්තර්ගතය | ලකුණු 07 යි. |
| 3. | ශිල්පීය දක්ෂතා | ලකුණු 03 යි. |
| | | මුළු ලකුණු 15 යි. |

**1. ආකෘතිය - ලකුණු 05 යි.**

| | |
|---|---|
| 1. ශීර්ෂ පාඨය / මාතෘකාව | ලකුණු 01 යි. |
| 2. පළ කරන්නාගේ නම | ලකුණු 01 යි. |
| 3. පළ කරන දිනය | ලකුණු 01 යි. |
| 4. නිර්මාණාත්මක භාවය | ලකුණු 02 යි. |

**2. අන්තර්ගතය - ලකුණු 07 යි.**

i. 'සයුර' නමින් පොත්හලක් විවෘත වන බව

ii. අංක 42, මහවීදිය, අනුරාධපුර ලිපිනයෙහි පිහිටා ඇති බව

iii. දිනපතා විවෘත ව තැබෙන බව

iv. විවෘත ව තැබෙන වේලාව පෙ.ව. 8.00 - ප.ව. 7.00 තෙක් බව

v. පෝය දිනවල වසා තැබෙන බව

vi. විවිධ විෂයවලට අයත් පොත්පත් මෙන් ම පාඨශාලා උපකරණ මිලට ගැනීමේ අවස්ථාව හිමි වන බව

vii. ජනවාරි මාසයෙහි මිලට ගන්නා ද්‍රව්‍ය වෙනුවෙන් 10% ක වට්ටමක් හිමි වන බව

3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.

❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03කි.

**නැතහොත්**

**ප්‍රවෘත්ති පත්‍ර වාර්තාව**

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.

1. ආකෘතිය ලකුණු 03 යි.
2. අන්තර්ගතය ලකුණු 09 යි.
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි.

1. **ආකෘතිය - ලකුණු 03 යි.**
   1. මාතෘකාව - ලකුණු 01 යි.
   2. වාර්තා කරන්නේ කවුරුන් ද යන වග - ලකුණු 01 යි.
   3. යෝග්‍ය ලෙස සිද්ධි ගළපා තිබීම - ලකුණු 01 යි.

2. **අන්තර්ගතය - ලකුණු 09 යි.**
   1. කලා උලෙළෙහි සංවිධායකයන් සම්බන්ධ ව
   2. දිනය හා වේලාව
   3. ස්ථානය
   4. ප්‍රධාන ආරාධිතයා
   5. විශේෂ දේශනය
   6. දේශන මාතෘකාව
   7. ජයග්‍රාහකයන් වෙත තිලිණ හා සහතිකපත් පිරිනැමීම
   8. 'සාහිත්‍යදීපනී' සම්මානය
   9. නැටුම්, ගැයුම් ආදි විචිත්‍රාංග

3. **ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි ආනුපාතික ලකුණක් දෙන්න.

❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03කි.

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## III පත්‍රය

❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
❖ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

ප්‍රශ්න අංකය 01

අපේක්ෂණය - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 20යි

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ වී ඇත්තේ කුමක් ද?
(ආ) ජාතක කතා ඇසුරෙන් රචිත ගී කාව්‍ය දෙකක් නම් කරන්න.

(ii) ගුත්තිල ඇදුරු සඳ
........................................
........................................
සුදුසු අස්නෙක ගොසින් උන් සඳ
(අ) මෙම කවියේ මැද පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි තද කළු අකුරින් මුද්‍රිත පද දෙකේ අර්ථ වෙන වෙන ම දක්වන්න.

(iii) "මං අහපු ආරංචියක් නැහැ. කාගෙන් ද ආරංචි අහන්නේ?"
(අ) මෙම පාඨය ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?

(iv) **නිදහස මහ මුහුදක්** වේ
එහි උල්පත පුත, නුඹ වේ
(අ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ ඇතුළත් කාව්‍යාලංකාරය කුමක් ද?
(ආ) මෙම පද්‍ය ඛණ්ඩය ඇතුළත් පැදි පෙළේ නම කුමක් ද?

(v) "මම යන්නට නොනිස්සෙමි. සතර දෙනකු කෙරෙහි විස්වස් නැති."
(අ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය රචිත යුගය නම් කරන්න.
(ආ) මෙහි සඳහන් විශ්වාස නොකට යුතු සතර දෙනාගෙන් එක් අයකු සඳහන් කරන්න.

(vi) (අ) 'අපට වැසිකිළියක්' කෙටිකතාව ඇතුළත් කෙටිකතා සංග්‍රහය නම් කරන්න.
(ආ) මෙම කෙටිකතාවේ රචකයාගේ නම කුමක් ද?

(vii) "හොඳට ම වැඩි වුණොත් ඒක වට්ටි ජ්‍රැන්කු පන්සියයක්"
(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවරෙක් ද?
(ආ) මෙහි 'ජ්‍රැන්කු' යනුවෙන් හඳුන්වා ඇත්තේ කුමක් ද?

(viii) සත් රුවනින් නව නිදහන් මකු වී
පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ
(අ) මේ පද්‍ය ඛණ්ඩය මුලින් ම පළ වූ කෘතිය කුමක් ද?
(ආ) මේ කෘතියේ රචකයා විසින් රචනා කරන ලද නවකතා දෙක නම් කරන්න.

**(ix) (අ) රත්න ශ්‍රී විජේසිංහයන්ගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය නම් කරන්න.**

**(ආ) "ගිම්හානයේ ගිලන් වී කෘශ ව සුදුමැලි ව**
**ඇදී ඇදී ඉකි ගැසූ ගඟ තැවත පිරිපුන් ය"**
**මෙහි තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාඨයෙන් පැවසෙන අදහස ලියන්න.**

**(x) (අ) කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍ය දෙකක් නම් කරන්න.**

**(ආ) "සකිසඳ පෙනෙන් සමනොළ ගල නැගෙනහිර"**
**මෙහි 'සකිසඳ' යනුවෙන් ආමන්ත්‍රණය කර ඇත්තේ කාට ද?**

(ලකුණු 02 x 10 = 20 යි)

(i) (අ) මහෞෂධ පඬිතුමාගේ / බෝධිසත්වයන් වහන්සේගේ ප්‍රඥා මහිමය කියාපෑම.

(ආ) සසදාවත, මුවදෙව්දාවත, කව්සිළුමිණ

(ii) (අ) වීණා වයන ලෙස ඉඳ
පසෙක පනවන ලද

(ආ) උතුමා / උත්තමයා, උත්තමාර්ථ යන අරුත් ඇති ගෞරවාර්ථ පදයක්
ඒ වෙලාවෙ / ඒ මොහොතෙ / ඒ අවස්ථාවෙ / කල්හි

(iii) (අ) බැද්දේගම

(ආ) පුංචිරාළ / වෙදරාළ / රාළහාමි

(iv) (අ) රූපක / රූපකාලංකාරය

(ආ) ජාතික තොටිල්ල හෙවත් දරු නැළවිල්ල / මුනි සිරිපා සිඹිමින්නේ

(v) (අ) පොළොන්නරු යුගය

(ආ) සොරා, මුලින් අතුරා වාඩිවී සිටි කොළ, රජතුමා, කාන්තාව

(vi) (අ) නොනිමි සිත්තම හා තවත් කෙටිකතා

(ආ) කේ. ජයතිලක මහතා

(vii) (අ) මැටිල්ඩා / ලොයිසල් මහත්මිය

(ආ) ප්‍රංශයේ ව්‍යවහාර මුදල් ඒකකය / මුදල් ඒකකයක්

(viii) (අ) ප්‍රබුද්ධ

(ආ) තුං මං හංදිය, මනෝ මන්දිර

(ix) (අ) බිය නොවන් අයියණ්ඩි

(ආ) ග්‍රීෂ්ම / උෂ්ණ / වියළි කාලයේ ගඟේ වතුර අඩුවී, ජලයේ පැහැය වෙනස් වී, ගඟ හෙමින් ගලා යන බව

(X) (ix) (අ) හංස, සැළලිහිණි, ගිරා, කෝකිල, පරෙවි

(ආ) සැළලිහිණියාට

03. පුද්ගලයන්ගේ ප්‍රචණ්ඩත්වය හා ශික්ෂාකාමිත්වය උදෙසා බාහිර බලවේග හේතු වන ආකාරය අඟුල්මල් දමනය කතාව ඇසුරෙන් නිදසුන් දක්වමින් විමර්ශනය කිරීම මෙහි දී අපේක්ෂිත ය.

**(i) ප්‍රචණ්ඩත්වය කරා යොමු වන ආකාරය**

★ දිසාපාමොක් ඇදුරුතුමාගේ නියෝගය

★ වෙනත් ශිෂ්‍යයන්ගේ කේලාම් බස්

**(ii) ශික්ෂාකාමී ලෙස සමාජානුගත වන ආකාරය**

★ බුදුන් වහන්සේ හමුවීම හා එහි දී ඇති වන සාකච්ඡාව මගින් කරුණු අවබෝධ වීම

★ දරුණුකම නිසා ප්‍රචලිත වූ අංගුලිමාල යන නම වෙනුවට කොසොල් රජු 'භර්ගයො මන්ත්‍රාණි පුත්‍ර' යනුවෙන් මවුපියන්ගේ නම් මූලික කොට ගෙන තෙරුන් වහන්සේ හඳුන්වනු ලැබීම

★ සත්‍යක්‍රියා කොට මූඪගර්භ කාන්තාව සුවපත් කිරීමෙන් පසුව සමාජය විසින් අංගුලිමාල තෙරුන්ගේ යහපත් භාවය හා කරුණාවන්ත භාවය අගය කරනු ලැබීම

**නැතහොත්**

කෑරගල ගම හා වෙහෙර වැනුම ඇසුරු කර ගෙන කතුවරයා පරිසර වර්ණනයෙහි දක්වන දක්ෂතාව හා යමක අසිරිය තත්ත්වාකාරයෙන් දකින ආකාරය ඉදිරිපත් කළ යුතු ය.

**(i) පරිසර වර්ණනා රසවත් ලෙස ඉදිරිපත් කරන ආකාරය**

★ කුළින් කුළම සිහිල'ඹ වැහෙන කඳුරුය.....

★ සාර පලය අඹ දඹ රඹ ද වල්පිට....

★ පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට....

★ මිහ'ඹ මුවමඬල මෙන් දිලෙන හැම විට....

★ නුදුරු වැ සිහිලැ'ලී ය ගඟුලැ'ලී ය....

★ පවන්'ද පිපි තුරේ ය නිර තුරේ ය....

**(ii) යමක අසිරිය තත්ත්වාකාරයෙන් දැකීමේ කුසලතාව දක්වන ආකාරය**

★ පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට....

★ දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය....

★ කුළින් කුළම සිහිල'ඹ වැහෙන කඳුරුය....

★ නිබඳ පැසී පල ලඹ දෙන මිහිර'ඹය....

★ පවන්'ද පිපි තුරේ ය නිර තුරේ ය....

## ප්‍රශ්න අංකය 04

**4.** (i) උපදේශාත්මක අදහස් ඉදිරිපත් කිරීමත්

(ii) පොදු ජන වහර යොදා ගැනීමත් 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' යන ජන කවි පෙළ පාඨකයාගේ සිත් ගනී. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(i) අවස්ථා හා සිද්ධි නිරූපණයත්

(ii) භාෂාව රසවත් ලෙස යොදා ගන්නා ආකාරයත් සිංහබාහු නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

පාඨක සිත් ගැනීමට හේතු වූ උපදේශාත්මක හැඟීම් හා පොදු ජන වහර යොදා ගැනීම සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම අපේක්ෂිත ය.

**(i) උපදේශාත්මක අදහස් ඉදිරිපත් කිරීම**

- ★ නහින දෙහින කාලෙට පින් කෙරුම යුත....
- ★ ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු....
- ★ ඇස නැති දා පොත ගත්තේ කියන්ටද....
- ★ එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා....
- ★ අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා....

**(ii) පොදු ජන වහර යොදා ගැනීම**

- ★ නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
- ★ වහින කලට කුරින් විල්වලින් එත
- ★ වෙර නැති දා ගහගත්තේ දිනන්ට ද
- ★ දත නැති දා උක් දඬු ගිනි තපින්ටද
- ★ ඉතින් ළඳේ කරිවිල තිබ්බටු සේමා
- ★ පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද
- ★ අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා

**නැතහොත්**

අවස්ථා හා සිද්ධි නිරූපණයත් භාෂාව රසවත් ලෙස යොදා ගන්නා ආකාරයත් තහවුරු කිරීම සඳහා කරුණු ඉදිරිපත් කිරීම මෙහි දී අපේක්ෂිත ය.

**(i) අවස්ථා හා සිද්ධි නිරූපණය**

- ★ සිංහබාහු හා සිංහසීවලී තුළ පැවති සැකය දුරු කිරීමට සුප්පා දේවිය දරන උත්සාහය හා ඇගේ ක්‍රියාකලාපය දැක්වෙන අවස්ථා
- ★ ලෙනෙන් පිට ව යාමට දරන ප්‍රයත්නය
- ★ සුප්පා දේවිය දෙගිඩියාවකට පත් වන අවස්ථාව
- ★ සිංහයාගේ ප්‍රකෝපකාරිත්වය හා පශ්චාත්තාපය දක්වන අවස්ථාව

ප්‍රශ්න අංකය 07

7. පුද්ගල චරිත සංවර්ධනයෙහි ලා 'ජාතික තොටිල්ල' පද්‍ය පන්තියෙන් නිරූපිත අදහස් උපයෝගී කර ගත හැකි ආකාරය, උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

නිර්දිෂ්ට පද්‍ය පන්තියෙන් පුද්ගල චරිත සංවර්ධනයට අදාළ ව අදහස් ඉදිරිපත් කර තිබීම අවශ්‍ය ය.

- ★ තමන් ලැබූ දිවි පෙවෙතේ....
- ★ ඉටු කොට කළ යුතු යුතුකම්....
- ★ කරදර දහසක් හමු වී....
- ★ කාටත් හිමි පොදු දේ නම්....
- ★ මිතුරුකමින් පෙරට එතොත්....
- ★ සිනිඳු මොළොක් බව මලෙහී....